www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඇමෙරිකාව පාලනය කරන්නේ කවුද?

## Who rules America?

**2013 ජුනි 10**

ඇමරිකානු පුරවැසියන් ගැන පමනක් නොව ලොව පුරා දසලක්ෂ ගනන් ජනතාවන් ගැන ද ආන්ඩුවේ රහසිගත ඔත්තු බැලීම් යුක්ති සහගත යයි  ජනාධිපති බැරක් ඔබාමා විසින් තහවුරු කරනු ලැබීමෙන් පසුව මහා පරිමානයේ ඔත්තු බැලීම ගැන තොරතුරු හෙලිදරව් කරන අයට නඩු පවරන බවට ජාතික ඔත්තු සේවා අධ්‍යක්ෂ ජේම්ස් ක්ලැපර් තර්ජනය කරයි.

පෙන්ටගනය මත පදනම් වූ ජාතික ආරක්ෂක ඒජන්සියේ වැඩ සටහන් "ඉවක් බවක් නැතිව එලිදරව් කිරීම" ගැන බ්‍රිතාන්‍යයේ *ගාඩියන්* පුවත් පත සහ එක්සත් ජනපද *වොෂිංන්ටන් පෝස්ට්* පුවත් පත් හෙලා දකින්නා වූ ප්‍රකාශනයක් ක්ලැපර් 8 දා නිකුත් කලේ ය. මෙම වැඩ සටහන් යටතේ ඇමරිකානු සහ ලෝක පුරවැසියන් ගැන දවස් පතා ඔත්තු බලන අතර ඊමේල් පනිවුඩ" සාකච්ඡා ඡායාරූප සහ ක්‍රෙඩිට් කාඩ්වල රිසිට් පත් ඇතුලු අන්තර්ජාල පනිවුඩ හුවමාරු කිරීම් සිය කෝටි ගනනක් පිටපත් කර ගනියි.

මෙම ඔත්තු බැලීම් හෙලිදරව් කිරීම් ගැන අපරාධ පරීක්ෂනයක් ඇරඹීමට ආන්ඩුව බලාපොරොත්තු වන බවට අධිකරන දෙපාර්තමේන්තුවේ සහ එෆ්බීඅයි සංවිධානයේ නිලධාරීන් කල ප්‍රකාශ රොයිටර් පුවත් සේවය උපුටා දක් වීය. ඔබාමා පාලනයේ මතයට අනුව අපරාධකාරී වන්නේ ඇමරිකන් ජනතාවගේ පුද්ගලික අයිතීන් ව්‍යවස්ථා විරෝධී ලෙස අමු අමුවේම උල්ලංඝනය කිරීම නොව මහජනතාව ඉදිරියේ ඒවා හෙලිදරව් කිරීමයි.

පසු ගිය සිකුරාදා ඔබාමා කල ප්‍රකාශ තුල දී ඔහු ජාතික ආරක්ෂක ඒජන්සියේ වැඩසටහන් ආරක්ෂා කල අතර මාධ්‍ය වාර්තා "උන්මාදයක්" ලෙස හඳුන්වමින් ජනතාව පිලිබද රාජ්‍ය සුපරීක්ෂක ජාලය අයිතීන් පිලිබද ප්‍රඥප්තියේ  "නව්‍ය විනිවිදීමක්'' බව කියා සිටියේය මෙය පෙන්වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් පිලිබඳ කුමන හෝ සංකල්පයක් මුලුමනින් ම අතහැර දැමීමකි. කලින් ආංඩුක්‍රම පිලිබද කථිකාචාර්වරයෙකු ව සිටි මොහු ප්‍රකාශයට පත් කරන්නේ ඇමරිකා එක්සත් ජනපදය පදනම් වී ඇති ආන්ඩුක්‍රම රාමුව සමග පවතින බැඳීරුම් සම්බන්ධතා සහමුලින්ම කඩා ගත්තා වූ පාලක පන්තියක දැක්මයි.

ඔබාමා මුල් පුටුවෙහි වැජඹෙන්නේ  ඇමරිකන් පුරවැසියන් ද ඇතුලු ලෝකය පුරා ජනතාව දන්ඩ මුක්තික හා තනි තීන්දු මත ඝාතනය කිරීමට හැකිවූ ද එසේ ඝාතනය කරන්නාවූ ද බොස්ටන් නුවරට මැතදී කලාක් මෙන් සමස්ත නගර ම යුද්ධ නීතියට යටත් කිරීමට හැකියාවක් පවතින්නා වූ ද පරීක්ෂක මාධ්‍යවේදීන් ගේ දුරකතන පනිවුඩ වාර්තා සහ ඊ මේල් පනිවුඩ ආන්ඩුවේ අත්අඩංගුවට ගනු ලබන්නා වූ ද හමුදා සොල්දාදුවෙක් වන බ්‍රැඩ්ලි මැනිං වැනි ඇමරිකාවේ යුද්ධ අපරාධ හෙලිදරව් කරන්නන්ට වධ දෙමින් ඔවුන් රාජ ද්‍රෝහි වීම ගැන නඩු පවරන්නා වු ද ත්‍රස්තවාදීන් යැයි චෝදනා කරනු ලැබුවන් නඩු නොමැති ව සහ අවිනිස්චිත ව සිරකඳවුරුවල සිර කර තැබීමට ජනාධිපතිට බලය ඇත්තාවූ ද රටක ය.

මෙම වර්ධනයන් තුලින් මතු කෙරී ඇති ප්‍රශ්නය නම් ඇමරිකාව පාලනය කරන්නේ කවුද? යන්න යි.

ආරක්ෂා කිරීමට තමා දිවුරා පොරොන්දු වී ඇති ආන්ඩුක්‍රමය උල්ලංඝනය කිරීම යුක්ති සහගත කරමින් ඔබාමා අවධාරනය කරන්නේ ඒවාට කොන්ග්‍රසයෙන්  උපදෙස් ලබා ගෙන ඇති බවත් එහි අනුමැතිය ලැබී ඇති බවත් ය. එය සත්‍යයකි. ඒ සමගම ඔහු උසාවිවලින් ඒවාට දී ඇති අනුමැතියට ද නිවැරදිව ඇඟිල්ල දිගු කර පෙන්වයි.

එහෙත් කවුරුත් දන්නා කරුනක් නම් තමන් ගේ  ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් විනාශ කිරීම සම්බන්ධයෙන් ඇමරිකන් ජනතාවගේ කැමැත්ත විමසා බලා නැති බවත් ඒ සම්බන්ධයෙන් ඔවුන්ට බොරු කියා ඇති බවත් ඔවුන් අඳුරේ තබා ඇති බවත් ය. එදිනෙදා දේශපාලන ජීවිතය සමග ජනතා පරමාධිපත්‍යය ගැටගැසී ඇති  තුනී සබඳතා බරපතල ලෙස උල්ලංඝනය කෙරී ඇති දේශපාලන ක්‍රමයක් හැඳින් වීම සඳහා "ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය" යන්න වැරදි යෙදුමකි.

ඇමරිකන් ජනතාව ක්‍රමානුකූලව හා නීති විරෝධී ව පරීක්ෂනයට ලක් කිරීමට මිලිටරි රහස් ඔත්තු සේවා ද ජාතික ආරක්ෂක ආයතනය ද මහා සංගතයන් ද රහසේ සහයෝගී වීම හෙලිදරව් කරන්නේ ඇමරිකා එක්සත් ජනපදයේ සැබෑ බලය දරන්නේ කවුරුන් ද යන්න යි.

ඒටීඇන්ඩ්ටී වෙරිසන් හා ස්ප්‍රින්ට් වැනි ටෙලිකොම් ආයතන ද ගූගල් මයික්‍රෝසොප්ට් ෆේස්බුක් සහ ට්විටර් වැනි අන්තර්ජාල කොම්පැනි ද මිලියන දහස් ගනනක් ජනයා ගැන දත්ත එෆ්බීඅයි සහ සීඅයිඒ වැනි සංවිධානවලට ලබා දෙන්නේ එම රාජ්‍ය ආයතනවලට ඒවා අයිති කර ගැනීමට අයිතියක් නැති බව නොතකමිනි.

ඇත්ත වශයෙන් ම රට පාලනය කරන සන්ධානය වන මිලිටරියේ, රහස් ඔත්තු සේවාවන්හි හා වෝල් වීදිය ගනු ලබන පියවරයන්ට තබන රබර් මුද්‍රාවක් ලෙස කොන්ග්‍රසය හා ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක ක්‍රියා කරති. ඊනියා හතර වැනි පන්තිය හෙවත් ජන මාධ්‍ය මෙම පාලක ත්‍රිත්වයේ අන්ඩක් ලෙස නිර්ලජ්ජිතව ක්‍රියාත්මක වෙයි. කොන්ග්‍රසයේ සියල්ලටත් වඩා ඩිමොක්‍රැටික් පක්ෂයේ බියගුලුකම සහ  සහචරකම ද ජාතික ඔත්තු බැලීමේ වැඩසටහන් හෙලිදරව් කිරීමට ජනමාධ්‍ය දක් වූ ප්‍රතිචාරය මගින් ප්‍රදර්ශනය කෙරුනු යටහත් භාවය ද ඒකාධිපතිත්වය කරා යන ගමනේ තවත් ඉදිරියට

යැමට මිලිටරිය සහ ඔත්තු සේවාවන් උනන්දු කරවයි. ඔත්තු බැලීමේ වැඩ සටහන්වල "බලවත් ම" විවේචකයා ලෙස ඉදිරියට දමා ඇති ඩිමොක්‍රැටික් පක්ෂ සෙනෙට් සභික මාක් උදාල් සීඑන්එන් රූපවාහිනී සේවයේ "රටේ තත්ත්වය" වැඩ සටහනකට පසු ගිය ඉරිදා දුන් සම්මුඛ සාකච්ඡාව පටන් ගත්තේ "ත්‍රස්තයට එරෙහි යුද්ධයට" ඔහුගේ සහාය පල කරමින් හා රහස් යැයි වර්ග කරනු ලැබූ තොරතුරු හෙලිදරව් කිරීම හෙලා දකිමිනි.

ප්‍රධාන පුවත් පත්වලින් එකක් වත් ඔත්තු බැලීම අවසන් කිරීමට හෝ එන්එස්ඒ ආයතනය වසා දැමීමට හෝ  නීති විරෝධී ඔත්තු බැලීමේ යෙදෙන නිලධාරීන්ට එරෙහි ව නඩු පැවරීමට හෝ ජනාධිපති නික්සන් කරන ලද නීති විරෝධී ක්‍රියාවන් සියල්ල ම ඉක්මවා ගිය ආන්ඩුක්‍රම ව්‍යවස්ථා උල්ලංඝනය ඇතුලු මහා අපරාධ සහ වැරදි ක්‍රියා කර ඇත්තා වූ ඔබාමාට විරුද්ධ ව දෝෂාභියෝග විභාගයක් පැවැත් වීමට හෝ ඉල්ලා නැත. නිව්යෝක් ටයිම්ස් පුවත් පත "දත්ත භාරා ඇවිස්සීම ත්‍රස්තයට එරෙහි සටනේ දී තීරනාත්මක අවශ්‍යතාවයකි" යන මැයෙන් ලිපියක් 08දා පල කලේ ය. ඔත්තු බැලීමේ වැඩ සටහන ලැජ්ජා විරහිත ව ආරක්ෂා කිරීම සඳහා ලිපිය තුල හිටපු ඔත්තු සේවා නිලධාරියෙකු ගේ ප්‍රකාශයක් උපුටා දැක් වීය.

ඔබාමා පාලනය පූර්වයෙන් පැවති කිසිදු පාලනයකට වඩා බලය තහවුරු කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රභූ ව සමග සන්ධානගත මිලිටරිය සහ සීඅයිඒ ඔත්තු සේවය සමග අත්වැල් බැඳගෙන ඇත. ඇමරිකාවේ හිටපු ජනාධිපති අයිසන්හවර් 1961 දී "මිලිටරි- කාර්මික සංකීර්නය" ලෙස හඳුන් වනු ලැබූ දෙයෙහි නිතිපතා වර්ධනය වන බලය ඔබාමා යටතේ විධායක අංශය සහ ජාතික ආරක්ෂක යන්ත්‍රනය ඒකාබද්ධ කිරීම මගින් එක්තරා පූර්නත්වයන් ලබා ඇත.

ඔබාමා ගේ පුද්ගලික පසුබිම මගින් ඔහු මෙම ක්‍රියාදාමයට සුදුසු ම වාහකය බවට පත්ව ඇති බව පෙනේ.

ඔබාමා ඔහු ගේ උපාධිය ලබා ගැනීමෙන් පසු ව රටවල් ගනනාවක සීඅයිඒ වැඩ කටයුතුවලට තමන් ආරක්ෂාව ලබා දුන්නේ යයි එහි ආරම්භකයා විසින්ම පිලි ගනු ලැබුවාවූ "බිස්නස් ඉන්ටර්නැෂනල්" නම් ආයතනයේ වසරක් රැකියාව කල බව කවුරුත් දන්නා කරුනකි.

එසේ වෙතත් එක්සත් ජනපදය තුල පාලනයේ ඒකාධිපති ක්‍රම මතුවීමේ දී ක්‍රියාත්මක වන මූලික සමාජ බලවේග වෙතින් අවධානය අන් අතකට යොමු කර ගැනීමේ  හේතුවක් බවට ඔබාමා ගේ පුද්ගලික ජීවිත කථාව පත් නොවිය යුතු ය. අද කිසිවකුට නැතැයි කිව නොහැකි කරුනක් වන්නේ "ත්‍රස්තයට එරෙහි යුද්ධය" ඇමරිකන් ජනතාවට එරෙහි යුද්ධයක් එනම් ජාත්‍යන්තර වශයෙන් අධිරාජ්‍යවාදී යුද්ධයට කවරයක් සහ එක්සත් ජනපදය තුල ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි නොනවත්වා කෙරෙන ප්‍රහාරයක්"  ඇති බව ය.

රටේ ජීවත් වන සෑම මිනිසෙක් ම සෑම ගැහැනියක් ම සහ සෑම දරුවෙක් ම එල්ල කර ගත්තා වූ ඔත්තු බැලීමේ අති දැවැන්ත පරිමාව එක් ප්‍රශ්නයක් මතු කරයි: පාලකයින්  බිය වී ඇත්තේ කාට ද?

තමන් සමාජීය මෙන් ම දේශපාලන වශයෙන් ද හුදකලා වී ඇතැ යි ද තමා ක්‍රියාත්මක කරන්නා වූ පිලිවෙත්වලට බැරෑරුම් සහයෝගිතා පදනමක් නැතැයි ද යන හැඟීමේ අවතාරය පාලක පන්තිය තුල හොල්මන් කරයි. ධනේශ්වර පද්ධතියේ අර්බුදය මගින් අනවනු ලැබ ජනතාව ගෙන් අති විශාල බහුතරයක ගේ ජීවන තත්ත්වයන්ට පහර දෙන අතර සංගත-මූල්‍ය ප්‍රභූවට හැඟී යන්නේ අර්බුදයේ ප්‍රතිඵලවලින් තමා තර්ජනයට ලක් වී ඇති බවයි. තමා ගොඩ නගා ඇති මූල්‍යමය අට්ටාලය ඕනෑම මොහොතක දී කඩා වැටී විප්ලවවාදී සමාජ නැගිටීම් පුපුරා යෑමට ඉඩ ඇති බව ඔවුහු දනිති.

එහෙත් පාලක පන්තියට මේ උභතෝකෝටියට ඇත්තේ එක් විසඳුමක් පමනකි. එය නම් ප්‍රචන්ඩ මර්දනය පමණකි. රාජ්‍යයේ පොලිස් බලතල නොනවත්වා වැඩි කරන්නේ මේ නිසා ය. ඒවා එල්ල වී ඇත්තේ ත්‍රස්තවාදීන්ට එරෙහිව නොව කම්කරු පන්තියට එරෙහිව ය.

දේශපාලන සංස්ථාපිතයට අයත් වන්නා වූ කිසිම කොටසක් හෝ කිසිම නිල සංස්ථාවක් හෝ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එරෙහි ප්‍රහාරයට විරුද්ධව සටන් නොකරනු ඇත.

ඩිමොක්‍රටික් පක්ෂයත් ඊනියා "ලිබරල්" සංස්ථාපිතයත් නැවත වරක් හෙලිදරව් කර ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සම්බන්ධයෙන් බැරෑරුම් කැප වීමක් ඔවුන්ට නැති බවයි. ඉතාමත් මෑත දී හෙලිදරව් වූ ගැඹුරින් ම අනාගාමී හා ප්‍රජාතන්ත්‍ර විරෝධී වූ ඔබාමා ගේ පිලිවෙත් ගැන සම්පූර්නයෙන් ම වාගේ නිශ්ශබ්දතාවය රකින නේෂන් සඟරාවත් ජාත්‍යන්තර සමාජවාදී සංවිධානයත් මගින් නියෝජනය කෙරෙන වාම ලිබරල්වාදී සහ ව්‍යාජ-වාම බලවේගවල කල්ලිත් ඔවුන්ට එකතු වී ඇත.

"වාමාංශික" වෙස් ගෙන සිටින නමුත් සත්තකින් ම දක්ෂිනාංශික වන්නා වූ මෙම කන්ඩායම් ඔබාමාට ලබා දෙන්නා වූ සහයෝගය නොමැති ව ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එරෙහිව මෙ වැනි දුර දිග යන ප්‍රහාර එල්ල කිරීමට රාජ්‍යයට නොහැකි වනු ඇත.

එහෙත් මෙම අයිතීන් කම්කරු පන්තිය තුල ගැඹුරින් දෝංකාර දෙන්නා වූ ඒවා ය. ප්‍රථම කොටම ඒවා විප්ලවවාදී අරගල තුලින් අත්පත් කර ගත් ඒවා ය. පාලක පන්තිය අද ඒවා විනාශ කිරීමට අධිෂ්ඨාන කර ගෙන සිටීම  ඇමරිකානු සහ ලෝක ධනවාදයේ ඓතිහාසික බංකොලොත් බවේ ප්‍රකාශනයකි. මෙම අයිතීන් ආරක්ෂා කිරීම දැන් පැවරෙන්නේ කම්කරු පන්තිය මතට ය.

දැන් වර්ධනය කල යුත්තේ වැඩ කරන ජනතාව ගේ සහ තරුනයින් ගේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයකි. ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීම ධනවාදයට සහ ධනපති රාජ්‍යයට එරෙහි අරගලයකින් වෙන් කිරීමට නොහැක. මෙම අරගලය මෙහෙය වීමේ යතුර නම් කම්කරු පන්තියේ නව විප්ලවවාදී නායකත්වය ලෙස සමාජවාදී සමානතා පක්ෂය ගොඩ නැඟීමයි.

**බැරී ග්‍රේ**

©www.wsws.org